ACCOUNTING RATIO ANALYSIS
(Part-II)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of Sri Jayewardenepura

ලාභදායීත්ව අනුපාත

ආයතනයක ලාභදායීත්වය මැනීම සදහා යොදා ගැනෙන අනුපාත, ලාභදායීත්ව අනුපාත ලෙස සරලව හැදින්විය හැක.

දළ ලාභ අනුපාතය

මෙහිදී ලාභදායීත්වය විකුණුම්වලට සාපේක්ෂව මැන ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කෙරේ.

$$\text{දළ ලාභ අනුපාතය} = \frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$

ClassWork.LK

ශුද්ධ ලාභ අනුපාතය

මෙහිදී ශුද්ධ ලාභය විකුණුම් වලට සාපේක්ෂව මැන ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කෙරේ.

ශුද්ධ ලාභ අනුපාතය = (කාලච්ඡේදයේ ලාභය / විකුණුම්) X 100

වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය

මෙහිදී මුළු වත්කම් හා ශුද්ධ ලාභය අතර සම්බන්ධතාවය සලකා බැලේ.

ශුද්ධ ලාභය ලෙස සැලකෙන්නේ පොලී අඩු කිරීමට පෙර ලාභයෙන් ආදායම් බදු අඩු කළ විට ලැබෙන අගයයි.

වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය = ((කාලච්ඡේදයේ ලාභය + පොලී) / මුළු වත්කම්) X 100

classwork.

හිමිකමට ප්‍රතිලාභ අනුපාතිකය

මෙහිදී අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනයත් කාලච්ඡේදයේ ලාභයත් අතර සම්බන්ධතාව සලකා බැලේ.

අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය ලෙස සැලකෙන්නේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයේත් සංචිතවලත් එකතුවයි.

$$\text{හිමිකමට ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{කාලච්ඡේදයේ ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය} + \text{සංචිත}} \times 100$$

ක්‍රියාකාරී අනුපාත

තොග පිරිවැටුම් අනුපාතය

යම් කාලච්ඡේදයකදී ව්‍යාපාරයේ භාණ්ඩ තොගය විකුණුම් බවට පත්වන වාර ගණන මෙම අනුපාතයෙන් පෙන්නුම් කරයි.

$$\text{තොග පිරිවැටුම් අනුපාතය} = \frac{\text{විකුණුම් භාණ්ඩ වල පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$$

සාමාන්‍ය තොගය පහත පරිදි ගණනය කරයි.

$$\text{සාමාන්‍ය තොගය} = \frac{\text{ආරම්භක තොගය} + \text{අවසාන තොගය}}{2}$$

<u>තොග රඳවා ගැනීමේ කාලය</u>

භාණ්ඩ තොගය ව්‍යාපාරයේ රැඳී පවතින සාමාන්‍ය දින ගණන මෙයින් පෙන්නුම් කරයි.

$$\text{තොග රඳවා ගැනීමේ කාලය} = \frac{\text{දින 365}}{\text{තොග පිරිවැටුම් අනුපාතිකය}}$$

$$\text{තොග රඳවා ගැනීමේ කාලය} = \frac{\text{සාමාන්‍ය තොගය}}{\text{විකුණුම් භාණ්ඩ වල පිරිවැය}} \times \text{දින 365}$$

ණයගැති පිරිවැටුම් අනුපාතිකය

යම් කාලච්ඡේදයකදී ව්‍යාපාරයේ ණයගැතියන් සාමාන්‍යයෙන් කී වරක් මුදල් බවට පත් වන්නේ ද යන්න මෙම අනුපාතයෙන් දැක්වේ.

$$\text{ණයගැති පිරිවැටුම් අනුපාතිකය} = \frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණය ගැතියෝ}}$$

සාමාන්‍ය ණයගැතියෝ පහත පරිදි ගණනය කරයි.

$$\text{සාමාන්‍ය ණයගැතියෝ} = \frac{\text{ආරම්භක ණයගැතියෝ} + \text{අවසාන ණයගැතියෝ}}{2}$$

<u>සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය</u>

ණයගැතියන් ණය පියවීමට සාමාන්‍යයෙන් ගන්නා කාලය මෙයින් පෙන්නුම් කරයි.

$$\text{සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය} = \frac{\text{දින 365}}{\text{ණයගැති පිරිවැටුම් අනුපාතිකය}}$$

$$\text{සාමාන්‍ය ණය එකතු කිරීමේ කාලය} = \frac{\text{සාමාන්‍ය ණයගැතියෝ}}{\text{ණයට විකුණුම්}} \times \text{දින 365}$$

අභ්‍යාසය - 01

සීමිත කල්පනී පොදු සමාගමේ ගිණුම් කාලච්ඡේදය 2022.03.31 න් අවසන් වූ වර්ෂය වේ. මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු ඔබ වෙත ඉදිරිපත් කෙරේ.

(රු.000)

ණයට විකුණුම්	90 000
ණයට ගැනුම්	60 000
2021. 04. 01 දිනට : තොගය	8 000
වෙළෙඳ ලැබිය යුතු දෑ	16 000
2022. 03. 31 දිනට : තොගය	12 000
වෙළෙඳ ලැබිය යුතු දෑ	14 000
මෙහෙයුම් වියදම්	9 000

ඉහත තොරතුරු ඇසුරෙන් පහත සඳහන් දෑ සඳහා පිළිතුරු ලබා ගන්න.

ClassWork.LK

1) විකුණුම් පිරිවැය ගණනය කරන්න.

2) සාමාන්‍ය ඉතිරි බඩු තොගය ගණනය කරන්න.

3) විකුණුම් පිරිවැය සාමාන්‍ය බඩු තොගයෙන් බෙදා ලැබෙන අගය වාර ගණනක් ලෙස ඉදිරිපත් කරන්න.

4) සාමාන්‍ය බඩු තොගය, විකුණුම් පිරිවැය අගයෙන් බෙදා ලැබෙන අගය දින 365න් ගුණ කර ලැබෙන අගය දින ලෙස දක්වන්න.

5) සාමාන්‍ය ණයගැතියන් ගණනය කරන්න.

6) ණයට විකුණුම් වටිනාකම, සාමාන්‍ය ණයගැති වටිනාකමින් බෙදා ලැබෙන පිළිතුර වාර ගණනක් ලෙස ඉදිරිපත් කරන්න.

7) සාමාන්‍ය ණයගැති වටිනාකම ණයට විකුණුම් වටිනාකමින් බෙදා ලැබෙන අගය දින 365න් ගුණ කර ලැබෙන අගය දින ලෙස දක්වන්න.

ClassWork.LK

අභ්‍යාසය - 02

හංසනී සමාගමේ වර්ෂ දෙකක් සඳහා ගණනය කරන ලද අනුපාත කිහිපයක් පහත දැක්වේ.

	2022	2021
තොග රැඳවුම් අනුපාතය (වාර)	18	15
තොග රැඳවුම් කාලය (දින)	20	24
ණයගැති පිරිවැටුම් අනුපාතය (වාර)	10	12
ණය එකතු කිරීමේ කාලය (දින)	36	30

ඉහත තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පහත ප්‍රශ්ණ වලට පිළිතුරු ලියන්න.

1) තොග අලෙවිය වඩාත්ම කාර්යක්ෂම වර්ෂය
2) ණය එකතු කිරීමේ කාලය කාර්යක්ෂමව සිදු වූ වර්ෂය
3) ක්‍රියාකාරිත්වය අතින් වඩාත් කාර්යක්ෂම ගිණුම් වර්ෂය

ClassWork.LK

අභ්‍යාසය - 03

1) ලාභදායි අනුපාත ගණනය කිරීමෙන් ව්‍යාපාරයට අත් වන වාසි කෙටියෙන් පැහැදිලි කරන්න.

2) සීමිත කැපිටල් පොදු සමාගමේ ගිණුම් කාලච්ඡේදය 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය වේ. සමාගමේ වාර්ෂික විකුණුම් රු. 500 000 වන අතර දළ ලභය විකුණුම්වලින් 40% කි. පොළිය හැර මෙහෙයුම් වියදම් රු. 65 000ක් ද පොලී වියදම රු. 15 000ක් ද වේ. වර්ෂයේ ආදායම් බද්ද රු. 30 000කි. මුළු වත්කම් රු. 600 000ක් වන අතර, හිමිකම මුළු වත්කම්වලින් 75%කි.

පහත සඳහන් අනුපාත ගණනය කරන්න.

i) ශුද්ධ ලාභ අනුපාතිකය
ii) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය
iii) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතිකය

3) ශුද්ධ ලාභය 30%ක මට්ටමක් කරා ළඟා කරවීමට නම්, ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න.

Classwork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura